මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\ 36

2023.02.13

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023
## රජයේ කාර්යාල හෝ ආයතන තුළ ඡන්ද ආයාචනා කිරීමෙන් අත් පත්‍රිකා බෙදීමෙන් වැළකී සිටීමේ අවශ්‍යතාව

කිසිදු රජයේ හෝ පළාත් සභා කාර්යාලයක හෝ රජයේ පාඨශාලාවක, පළාත් පාලන ආයතනයක, වෙනත් රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල සතු ආයතනයක දී පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා තරග වදින අපේක්ෂකයන් වෙනුවෙන් ඡන්දය ආයාචනා කිරීමේ, අත් පත්‍රිකා බෙදීමේ හෝ වෙනත් එවැනි කාර්යයන් සිදු කිරීම හෝ රැස්වීම් පැවැත්වීම තහනම් ය. එබැවින් එවැනි ක්‍රියාවලින් වැළකී සිටීම අත්‍යවශ්‍ය බව සියලුම දේශපාලනඥයින් හෝ දේශපාලන ක්‍රියාකාරීන් හා වෘත්තීය සමිති ක්‍රියාකාරීන් වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ස්වකීය පාලනය යටතේ ඇති රජයේ හෝ පළාත් සභා කාර්යාලවල හෝ පාඨශාලාවල හෝ පළාත් පාලන ආයතනවල හෝ රජයේ ආයතනවල සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල මෙවැනි නීති විරෝධි ක්‍රියා සිදු කිරීමට ඉඩ නොදීම එම රාජ්‍ය ආයතන ප්‍රධානීන්ගේ හා උප කාර්යාල ප්‍රධානීන්ගේ වගකීම වේ. මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:4 සහ 2:5 ඡේද කෙරෙහි අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

ඡන්ද විමසීම් කාලසීමාව තුළ දී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (4) (අ) ව්‍යවස්ථාව අනුව මැතිවරණ කොමිෂන් සභාව නිකුත් කළ විධාන ඇතුළත් අංක 2313/32 හා 2023.01.04 දිනැති ශ්‍රී ලංකා අති විශෙෂ ගැසට් පත්‍රයේ සඳහන් කරුණු කෙරෙහි ද අවධානය යොමු කරන ලෙස මෙයින් නිවේදනය කරමි.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්